# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2159/35 - 2020 ජනවාරි මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2020.01.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: රඹු/574.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/7/2016/එච්ඩබ්ලිව්/57.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය:*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වල්ගම් පත්තුව සුළු කොට්ඨාසයේ, අංක 3 එෆ් පරපේ ග්‍රාම නිලධාරී වසමට අයත්, පරපේ ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක අ.ග.පි. 96, අතිරේක අංක 18, පත්‍ර අංක 15 දරන සැලැස්මේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබලි.

1. **කැබලි අංක 924**
ඉඩමේ නම: මිල්ලගහමුලවත්ත, මීදෙනියෙවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩබ්. ඩී. ඇල්ඩින් නෝනා; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0065.

2. **කැබලි අංක 957**
ඉඩමේ නම: මිල්ලගහමුලවත්ත, මීදෙනියෙවත්ත; විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: යූ. ඩී. සිරිපාලි (යූ. ජී. විජේසූරිය විසින් භුක්ති විඳී); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0195.

ඉහත සඳහන් ඉඩම්වලට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2020 පෙබරවාරි මස 23 වැනි දින පෙ. ව. 10.00 ට රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2020 පෙබරවාරි මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

ඩබ්ලිව්. එල්. ආර්. ඉන්දික ලියනගේ,
ප්‍රාදේශීය ලේකම්,
රඹුක්කන.

2019 දෙසැම්බර් මස 27 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-78


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ සංශෝධිත දැන්වීම

*මගේ අංකය*: 3/6/2016/5-1.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/7/2016/එච්ඩබ්ලිව්/82.

මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2004/72 හා 2017 පෙබරවාරි මස 03 වැනි දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 7 වන වගන්තිය යටතේ දැන්වීමෙහි අනු අංක 80 හා 81 යටතේ සඳහන් කර ඇති අංක 99 හා 100 දරන බිම් කැබලි සඳහන් ඡේදය මෙයින් අවලංගු කරනු ලැබේ.

ඒ වෙනුවට මූලික පිඹුරු අංක කු 2423 හි කැබලි අංක 1 හා 4 දරන ඉඩම් කැබලි මෙයින් ආදේශ කරනු ලබන බව මහජනතාවගේ දැනගැනීම සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. **කැබලි අංක 01**

ඉඩමේ නම: හෙලඋඩවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: බෝගමු ආරච්චිලාගේ රන්මැණිකා; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0854.

2. **කැබලි අංක 04**

ඉඩමේ නම: හෙලඋඩවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ආරියනන්ද දෙඹගහවත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0265.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2020 පෙබරවාරි 19 වැනි දින පෙ. ව. 10.00 ට පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2020 පෙබරවාරි 05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වාභාවයත් එකී ඉඩම්/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

ඩී. අනෝමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
පොල්ගහවෙල.

2020 ජනවාරි මස 07 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-88

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.